ලංකාපුර ප්‍රාදේශීය සභාව
--------------------------------
පොළොන්නරුව දිස්ත්‍රික්කය
----------------------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 19 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්වාගණනය කළ මතය
-----------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ලංකාපුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-------------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
--------------------------------.

ගබඩා ද්‍රව්‍ය සම්බන්ධයෙන් අත්තිකාරම් ගිණුම් ක්‍රමය අනුගමනය කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
--------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු එකතුව රු. 156,703 ක් වූ වියදම් විෂයයන් 03 ක් උපචිත වියදම් යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘති සඳහා ගෙවිය යුතු එකතුව රු. 850,081 ක කර්මාන්ත ණයහිමි ශේෂ 02 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට සභාව විසින් ඉටුකරනු ලැබූ ව්‍යාපෘති 03 ක් සඳහා ගෙවිය යුතු රු. 424,058 ක මුදල් ණයහිමි ශේෂ යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

(ඈ) 2017 දෙසැම්බර් 31 දිනට විදුලි ගබඩා ලේඛනයට අනුව එකතුව රු. 47,770 ක් වූ භාණ්ඩ ඒකක 06 ක් ගිණුම් වලින් අත්හැරී තිබුණි.

(ඉ) සභාවට අයත් පුලස්තිගම ජල පොම්පාගාරය සඳහා මිලදී ගෙන තිබූ රු. 48,645 ක් වටිනා පැනල් බෝඩ් එකෙහි වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඊ) සභාවට අයත්ව තිබූ සහල් පිටි ආහාර නිෂ්පාදනාගාරයේ 2017 ජූනි 02 වන දිනට පැවති රු. 55,129 ක් වටිනා අතැති තොගය සුහසාධක සංගමයට භාරදී තිබුණු නමුත් තොගයෙන් ඉවත් කර නොතිබුණි.

(උ) සභාවට අයත් පිලිසරු ව්‍යාපෘතිය සඳහා විදුලි සැපයුම ලබාගැනීම වෙනුවෙන් ගෙවන ලද රු. 111,456 ක මුදල ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඌ) සේවක ණය ලේඛනයට අනුව සමාලෝචිත වර්ෂයේ සේවක ණය ශේෂය රු. 1,937,572 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වල එය රු. 1,815,944 ක් ලෙස දැක්වීම නිසා සේවක ණය ශේෂය රු. 121,628 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) 2016 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගත් පුස්තකාල පොත් ඌනතාවය වූ රු. 103,995 ක මුදල වත්කම් ගිණුමෙන් ඉවත් කලද ප්‍රාග්ධන යෙදවුමෙන් ආදායමට දායකවීමේ ගිණුමෙන් ඉවත් කර නොතිබුණි.

(ඒ) පෙර වර්ෂ වලට අදාල භාණ්ඩ සමීක්ෂණයේදී ඉවත් කරන ලද රු. 92,975 ක් වටිනා පුස්තකාල පොත් වටිනාකම ප්‍රාග්ධන යෙදවුමෙන් ආදායමට දායක වීමේ ගිණුමට හර කල යුතු වුවත් වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

1.3.3 නොසැඳුනු ගිණුම්

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොඩනැඟිලි 31 කට අදාලව උපලේඛන වල දැක්වෙන ශේෂයන්ගේ වටිනාකම් හා ස්ථාවර වත්කම් ලේඛනයෙහි දැක්වෙන වටිනාකම් අතර රු. 1,502,186 ක වෙනසක් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තැන්පත් ලේඛනයේ අත රැඳවුම් ශේෂ 3 ක වටිනාකම් සඳහන් කර නොතිබුණු නමුත් මූල්‍යප්‍රකාශන අනුව එම ශේෂවල වටිනාකම රු. 30,000 ක් විය.

(ඇ) ස්ථාවර වත්කම් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමේ ශේෂය අතර රු. 10,891,980 ක වෙනසක් පැවතුණි.

1.3.4 ලැබිය යුතු ගිණුම්

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබෙන ලැබිය යුතු ගිණුම් ශේෂ 3 ක වටිනාකම රු. 1,601,879 ක් වූ අතර කාල විශ්ලේෂණය අනුව වසර 5 කට වැඩි කාලයක සිට ලැබිය යුතු ශේෂ රු. 1,453,230 වූ අතර වසර 3 කට වැඩි ශේෂ රු. 63,571 ක් විය.

(ආ) 2017 දෙසැම්බර් 31 දින වන විට අයකර ගත හැකි උපයෝගී සේවා රු. 117,194 ක ශේෂය තුල ඇතුලත් රු. 60,563 ක රථ වාහන අලාභ හානි 2005 වර්ෂයේ සිටද රු. 40,000 ක අඟරු චෙක්පත 1999 වර්ෂයේ සිටද රු. 2,700 ක් වූ පරිගණක දත්ත ක්‍රියාකරුගේ වැටුප 2007 වර්ෂයේ සිටද අයවීමට තිබෙන නමුත් එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

-------------------------------------------------------

ලී බඩු හා සවි කිරීම් ගිණුමේ, පුස්තකාල පොත් ගිණුමේ, හිඟ හිටි කුලී ආදායම් ගිණුමේ, සේවක ඇප තැම්පත් ගිණුමේ සහ හිඟ හිටි ජල ආදායම් ගිණුම යන ගිණුම්වල වූ එකතුව රු. 7,802,608 ක ශේෂ වලට අදාලව තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

1.3.6 නීතී රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය | ප්‍රාදේශීය සභාවේ තල්පොත නගරය දියුණු කල ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කර 2014 අගෝස්තු 29 වන දින විෂයය |

| | |
|---|---|
| | භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන ඇතත් මෙතෙක් වරිපනම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛය | සුදුසුකම් ලැබූ යාන්ත්‍රික ඉංජිනේරුවෙකුගේ වාර්තාවක් ලබානොගෙන ට්‍රැක්ටරයක් අළුත්වැඩියා කර රු. 113,000 ක් ගෙවා තිබුණි. |
| (ඇ) 2015 දෙසැම්බර් 4 දිනැති පළාත් පාන කොමසාරිස්ගේ ලිපිය | 2015 දෙසැම්බර් මස සිට ලේකම් වෙත අනුයුක්ත කැබ් රථය සඳහා ඉන්ධන සීමාව මසකට ලීටර් 150 ක උපරිමයකට යටත් වන නමුත් සමාලෝචිත වර්ෂයේදී එම සීමාව ඉක්මවා ඉන්ධන ලීටර් 1990 ක් සඳහා රු. 18,050 ක් වැය කර තිබුණි |

**02 මූල්‍ය සමාලෝචනය**

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා, සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු. 9,566,538 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු. 18,743,422 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | - | - | - | - | - | - | - | - |
| (ii) | කුලී | 11,213,067 | 10,185,867 | 10,893,867 | 2,139,526 | 4,963,691 | 4,080,491 | 4,700,191 | 2,423,085 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,330,650 | 1,129,975 | 1,129,975 | - | 1,222,150 | 942,210 | 942,210 | - |
| (iv) | වෙනත් ආදායම් | 8,179,750 | 4,589,047 | 9,217,684 | 2,578,995 | 8,333,730 | 6,127,433 | 2,967,798 | 7,569,921 |
| | | 20,723,467 | 15,904,889 | 21,241,526 | 4,718,521 | 14,519,571 | 11,150,134 | 8,610,199 | 9,993,006 |

2.2.2 කුලී

-----

(අ) සෝමාවතිය පූජා භූමියේ රථගාල සඳහා වූ සියයට 25 ක ඉතිරි ටෙන්ඩර් ගාස්තුව වූ රු. 186,500 ක මුදල 2017 පෙබරවාරි 17 දින වන විට ගෙවා අවසන් කළ යුතු වුවත්, මාස 7 කට අධික කාලයක් ටෙන්ඩර්කරු විසින් ගාස්තු ගෙවීම පැහැර හැර තිබූ අතර ඒ සඳහා අයවිය යුතු රු. 32,330 ක ප්‍රමාද ගාස්තුව සමඟ හිඟය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආදායම් ලිපිගොනු අස්ථානගත වීම හේතුවෙන් 2017 ජනවාරි 01 දිනට රු. 101,265 ක හිඟ මස් කඩ ආදායම් සම්බන්ධයෙන් හා එම ලිපිගොනු භාරව කටයුතු කල විෂයභාර නිලධාරීන් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) 2012 වර්ෂයේ සති පොළ බදු දීම වෙනුවෙන් ලැබිය යුතු රු. 5,000 ක මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 බලපත්‍ර ගාස්තු

-----------------

(අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) 59 රීතිය ප්‍රකාරව කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් පවත්වා, ඒ අනුව බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි.

(ආ) ත්‍රී රෝද රථ 90 කින් අයවිය යුතු රු. 90,000 ක්වූ ත්‍රී රෝද රථ ලියාපදිංචි කිරීමේ ගාස්තු සමාලෝචිත වර්ෂය තුල රැස්කරගෙන නොතිබුණි.

2.2.4 වෙනත් ආදායම්

------------------

(අ) ලංකාපුර ප්‍රාදේශීය සභාවට අයත් බැකෝ ලෝඩර් යන්ත්‍රය කුලී පදනම මත ලබාදී සභාව වෙත අයවිය යුතුව තිබුණු රු. 76,076 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සහල් පිටි නිෂ්පාදන බේකරියේ සමාලෝචිත වර්ෂයේ ජනවාරි, පෙබරවාරි, මාර්තු යන මාස වල පිළිවෙලින් රු. 9,661 ක්ද, රු. 62,807 ක්ද, රු. 55,862 ක්ද, ලෙස ශුද්ධ අලාභයක් සිදුවී තිබුණි.

(ඇ) බල ප්‍රදේශය තුල විවිධ ආයතන 30 ක් මඟින් ප්‍රදර්ශනය කර තිබූ, ප්‍රචාරක දැන්වීම් පුවරු 173 කින් අයවිය යුතු දැන්වීම් පුවරු ආදායම් අයකරගෙන නොතිබුණි.

## 03. මෙහෙයුම් සමාලෝචනය

**-------------------------**

3.1 කාර්ය සාධනය

--------------------

ප්‍රාදේශීය සභා පනතේ 03 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව සහ සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබූ කර්තව්‍යන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 55 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණු අතර 2016 මාර්තු 30 දිනැති අංක 1960/35 දරන ගැසට් පත්‍රයේ පලකර තිබුණු 1952 අංක 6 දරන පළාත් පාලන අමාත්‍යවරයා විසින් (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත ප්‍රකාරව උතුරු මැද ප්‍රධාන අමාත්‍යවරයා විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථා වැළඳගැනීමට ද තීරණය කර තිබුණේ 2017 දෙසැම්බර් 06 දින පරිපාලන කමිටුවේදීය.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

---------------------

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් 53 ක ක්‍රියාකාරකම් ඉටුකිරීමේ විස්තර ඇතුලත් ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර නොතිබුණි.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශිත තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව සභාව දැනුවත් වී තිබුණද එම අරමුණු අතරින් සභාවට අදාල අරමුණු නිවැරදිව හඳුනාගෙන නොතිබුණි

(ii) අයවැය සකස් කිරීමේදී ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2017 ජූලි 31 දිනැති අංක BD/CBD/4/1/2-2018 දරනචක්‍රලේඛය අනුව හඳුන්වා දී ඇති දර්ශක සඳහා දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයන් සභාව තුල නොතිබුණි.

(iii) සංවර්ධන ඉලක්ක කරා ළඟාවීමේදී අදාල කාර්යයන් නියාමනය කිරීම සඳහා වූ සංධිස්ථානයන් හඳුනාගෙන නොතිබූ බැවින් දර්ශක සඳහා දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයක් ද නොතිබුණි.

(iv) ඉලක්ක කරා ළඟාවීම සඳහා 2016 හා 2017 වර්ෂවල අයවැය මඟින් එකතුව රු. 1,036,000 ක මුදල් ප්‍රතිපාදන කර තිබුණද එයින් වියදම් කර තිබුණේ රු. 285,000 ක් හෙවත් සියයට 27 ක් පමණි.

(v) තිරසාර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීම සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ ක්‍රමවේදයක් නොපැවති අතර අරමුණු ඉටුකර ගැනීම සඳහා සම්බන්ධ කරගත යුතු අනෙකුත් රාජ්‍ය ආයතන හඳුනාගෙන ද නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

(අ) සභාව විසින් භාවිතා කරනු ලබන නමුත් මුදල් අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර තිබුණු ඩබල් කැබ් රථයේ අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කොම්පෝස්ට් බවට පත්කරන ලද කැලි කසළ නිසිපරිදි ඇසුරුම් කර අලෙවි කිරීමට කටයුතු කර නොතිබීම නිසා සභාවට ලබාගත හැකිව තිබූ ආදායමක් අහිමි වි තිබුණි.

(ඇ) 2017 ග්‍රාමීය මාර්ග සංවර්ධන සතිය (පළාත් පාලන මාර්ග සතිය) සඳහා දුර කිලෝමීටර් 57.8 ක් වූ මාර්ග බොරළු යොදා සංවර්ධනය සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබුණද බොරළු යෙදීමකින් තොරව මෝටර් ග්‍රේඩර් කිරීම හා ජලය බැසයාමට පැති කාණු සකස් කිරීම පමණක් සිදුකර කර තිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

----------------------------------

සේවක පුරප්පාඩු හා අතිරික්ත

----------------------------------

(අ) සමාලෝචිත වර්ෂයේදී තෘතියික මට්ටමට අයත් ලේකම් තනතුර, ද්විතියික මට්ටමට අයත් සංවර්ධන නිලධාරී තනතුරු 04 ක්, කළමනාකරණ සහකාර තනතුරු 02 ක්, පුස්තකාලාධිපති තනතුරු 03 ක් හා වැඩ පරීක්ෂක තනතුරු 01 ක් පුරප්පාඩු වී පැවතුණි.

(ආ) අනුමත සේවක සංඛ්‍යාවට අතිරේකව ජල කම්කරුවෙක්, ආයුර්වේද කම්කරුවෙක්, කාර්යාල කාර්ය සහයකයෙක් හා පුස්තකාල සහයකයෙකු සේවයේ යොදවාගෙන තිබුණි.

3.4 මෙහෙයුම් ආකාර්යක්ෂමතා

-------------------------------

ජල ව්‍යාපෘති පරීක්ෂාව

-------------------------

2011 වර්ෂයේදී ප්‍රාදේශීය සභා අරමුදල් යොදවා ඉදිකල දේවාල ගොඩනැඟිල්ලේ ජල ව්‍යාපෘතිය දැනට වසර 02 කට පමණ පෙර සිට අත්හැර දමා තිබුණි. මෙම ව්‍යාපෘතියේ මෝටරය දැනට අක්‍රිය වී ඇති අතර ළිඳ හා ටැංකිය නිශ්කාර්යව පැවතුණි. ව්‍යාපෘතියේ විදුලි බිල රු. 23,000 ක් පමණ හිඟ හිටව තිබුණු අතර වෙනත් කිසිදු ජල ව්‍යාපෘතියක් නොමැති මෙම ප්‍රදේශයේ ක්‍රියාත්මක වූ එකම ජල ව්‍යාපෘතිය වන මෙම ව්‍යාපෘතිය ද වසර දෙකක කාලයක සිට අතහැර දමා තිබුණි.

3.5 වත්කම් කළමනාකරණය

------------------------------

3.5.1 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

-------------------------------------------

රු. 124,921 ක වටිනාකමකින් යුතු අංක 108 ශ්‍රී 1706 මෝටර් සයිකලය, පාපැදිය සහ ට්‍රේලර් බවුසර්යක් වසර 04 ක් පමණ කාලයක සිට නිශ්ක්‍රීයව පැවතුණි.

04. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

-------------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

------------------------

සමාලෝචිත වර්ෂයේ දී සභාවේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4.2 විගණන හා කළමනාරකණ කමිටු

---------------------------------------

ප්‍රාදේශීය සභාව විසින් 2017 වර්ෂය සඳහා විගණන කමිටු පිහිටුවා රැස්වීම් පවත්වා නොතිබුණි.

4.3 ප්‍රසම්පාදන සැලැස්ම

------------------------

ප්‍රාදේශීය සභාව විසින් 2017 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර ප්‍රසම්පාදන කටයුතු සැලසුම් සහගතව ඉටුකර නොතිබුණි.

**05. පද්ධති හා පාලන**

**-------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| | ---------- | | ---------------- |
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | (i) | සියළුම ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර යාවත්කාලීනව නොපැවැත්වීම |
| | | (ii) | අපහරණ කළ වත්කම්වල වටිනාකම් අදාල ලේඛනයෙන් ඉවත් නොකිරීම |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගිණුම්කරණය | | මුදල් රැස්කිරීම හා ගිණුම්ගත කිරීම යාවත්කාලීන නොවීම |
| (ඇ) | ආදායම් පරිපාලනය | (i) | ආදායම් ලේඛන යාවත්කාලීනව නොපැවැත්වීම |
| | | (ii) | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු නොකිරීම |
| (ඈ) | අභ්‍යන්තර පාලනය | (i) | අභ්‍යන්තර විගණනයක් සිදු නොකිරීම |
| | | (ii) | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නොපැවැත්වීම |
| (ඉ) | ණයගැති/ණයහිමි පාලනය | (i) | ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් නොකිරීම |
| (ඊ) | වාහන පාලනය | (i) | ඉන්ධන දැවීම පිළිබඳ පරීක්ෂා නොකිරීම |
| | | (ii) | වාහන පිළිබඳ සමීක්ෂණ නොපැවැත්වීම |